# ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය
# තාවකාලික පදනම මත කණිෂ්ඨ සේවකයින් බඳවා ගැනීම

- ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.
- පත්වීම් තාවකාලික පදනම මත වන අතර පැමිණීම මත පදනම් වූ දෛනික දීමනාවක් ගෙවනු ලැබේ.
- පළමු පත්වීම් කාලසීමාව අවසානයේදී වැඩ, හැසිරීම හා පැමිණීම මත සේවයේ නැවත පිහිටුවීම සඳහා සලකා බලනු ලැබේ.
- විශ්වවිද්‍යාලයීය ආකෘතියට අනුව පිළියෙල කළ අයදුම්පත් සහතික කල අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් සහතික පිටපත් සහ උප්පැන්න සහතිකයේ හෝ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක් සමඟ **ලේඛකාධිකාරී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනවිත් භාරදිය හැකිය.
- අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය **2024.10.07**

## තෝරාගැනීමේ ක්‍රමවේදය

- ප්‍රායෝගික පරීක්ෂණ සහ / හෝ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල අනුව.

## පොදු කොන්දේසි

01. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

02. අයදුම්කරුවන් තෝරා ගැනීම ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය විසින් අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව සහ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල පදනම් කරගෙන සිදු කරනු ලැබේ.

03. අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

04. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට පෙර ඔවුන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුය.

05. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් (**https://kdu.ac.lk**) භාගත කර ගත හැකි ආකෘති පත්‍රය මගින් පමණක් අදාළ තනතුර සඳහා ඉල්ලුම් කරන ලෙස අයදුම්කරුවන්ට දන්වා සිටින අතර ප්‍රමාද වී ලැබෙන, අසම්පූර්ණ හෝ නියමිත ආකෘතියට පරිබාහිරව යොමු කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එස්සීකේසී සන්දනායක
වැඩබලන ලේඛකාධිකාරී

Acting Registrar
General Sir John Kotelawala Defence University
Ratmalana

# 01. වැඩ සහායක (තාවකාලික)
# (රත්මලාන පරිශ්‍රය සඳහා)

## සුදුසුකම්

1. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන සාමාර්ථ දෙකක් සහිතව විෂයයන් 06 කින් සමත්ව තිබීම.

2. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 45 නොඉක්මවිය යුතුය.

3. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් සහ මනා සෞඛ්‍යකින් යුක්ත විය යුතුය.

## වැටුප් හා අනෙකුත් දීමනා

- රු. **1,500/-**ක දෛනික වැටුපක් ද, සේවයට පැමිණීම මත රජයේ අනුමත අනෙකුත් දීමනාවන්හි දෛනික අනුපාතයක් ද ගෙවනු ලැබේ. ඒ අනුව රු. **2,260/-**ක දෛනික වැටුපක් ගෙවනු ලැබේ.

- තවද වැඩ කරනු ලබන දින 20ක් සඳහා මසකට රු. **45,200/-** ක දළ වැටුපක් ද මීට අමතරව සේවා අවශ්‍යතාවය මත සති අන්තයේද රාජකාරීන් සඳහා පැමිණිය හැකි අතර අතිකාල දීමනාද ගෙවනු ලැබේ.

## අනෙකුත් වරප්‍රසාද

- සේවක අර්ථසාධක අරමුදලට ආයතනයෙන් 15% ක් ද සේවකයාගෙන් 10% ක් ද සේවක භාරකාර අරමුදලට ආයතනයෙන් 3% ක් ද බැර කරනු ලැබේ.